ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන
6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2025/2026
SNU6225 - පුනරුත්ථාපනය හා ප්‍රජා මූලික පුනරුත්ථාපනය
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2026.06.30 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 01 - වන කොටස

01. "පුනරුත්ථාපනය" යන පදය අර්ථ දක්වා, එය සුදුසු උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න.

02. ඌනතාව (Impairment) සහ දුබලතාව (Disability) යන පද අතර වෙනස උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

03. ලෝක සෞඛ්‍ය සංවිධානය (1980) විසින් බාධිතබව (Handicap) යන පදය අර්ථ දක්වා ඇති ආකාරය පැහැදිලි කරන්න.

04. ප්‍රජා මූලික පුනරුත්ථාපනයෙහි (CBR) මූලික පරමාර්ථය සඳහන් කරන්න.

05. දුබලතා සහිත පුද්ගලයින් සවිබල ගැන්වීමේ ක්‍රියාවලියේදී දේශපාලන සහභාගීත්වය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

06. පැරණි ශ්‍රී ලංකාවේ දුබලතා සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් පැවති මිථ්‍යා මත තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ශ්‍රී ලංකාවේ දුබලතා සහිත දරුවන්ට බලපාන නීති තුනක් (03) ලැයිස්තුගත කර, ඉන් එක් නීතියක් පැහැදිලි කරන්න.

08. පුද්ගලයෙකු දුබලතාවයට පත් විය හැකි ක්‍රම තුනක් (03) අවශ්‍ය සාධක/ සාක්ෂි සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x08=40)

---

## 02 - කොටස

09. (i.) දුබලතාවය පිළිබඳ වෛද්‍ය ආකෘතිය (Medical Model) සහ සමාජීය ආකෘතිය (Social Model) ඔබේ වචනයෙන් අර්ථ දක්වන්න. (ලකුණු 05)

(ii.) "දෘශ්‍යාබාධිත ශිෂ්‍යයකුට බ්‍රේල් (Braille) සම්පත් නොමැතිකම හේතුවෙන් පාසලේ ඉගෙනුම් ද්‍රව්‍ය පරිශීලනය කිරීමට නොහැකි වී ඇත. දුබලතාවය පුද්ගලයා විසින් නිර්මාණය කරගන්නා දෙයකට වඩා සමාජය විසින් නිර්මාණය කරනු ලබන්නකි."

- අදාළ උදාහරණ සහිතව, දුබලතාවය පිළිබඳ වෛද්‍ය ආකෘතිය සහ සමාජීය ආකෘතිය යන දෙකම භාවිත කරමින් ඉහත තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) දුබලතාවය සහිත පුද්ගලයන් සමාජයේ දී මුහුණ දෙන බාධක පහක් (05) සාකච්ඡා කර, සමාජීය ආකෘතිය මත පදනම්ව ඒ සඳහා ප්‍රායෝගික විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 08)

10. (i.) ප්‍රජා මූලික පුනරුත්ථාපනය (CBR) අර්ථ දක්වා, එහි ප්‍රධාන සංරචක (Core Components) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් පද්ධතිය තුළ, දුබලතා සහිත දරුවන් මූලික හඳුනා ගැනීමට සහ ඔවුන් සඳහා මැදිහත් වීමට (Early identification and intervention) ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් මඟින් සහය විය හැක්කේ කෙසේද යන්න විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

(iii.) ප්‍රජා මට්ටමින් ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදුවන අභියෝග විවේචනාත්මකව සාකච්ඡා කර, එම අභියෝග ජය ගැනීම සඳහා ප්‍රායෝගික උපාය මාර්ග යෝජනා කරන්න. (ලකුණු 08)

11. (i.) දුබලතාවය සහිත දරුවන් වෙනුවෙන් අන්තර්කරණ පිළිවෙත් (Inclusive practices) ප්‍රවර්ධනය කිරීමේ දී පාසල් සතු කාර්යභාරය පැහැදිලි කරන්න. අවම වශයෙන් ප්‍රධාන වගකීම් හතරක් (04) දක්වන්න. (ලකුණු 05)

(ii.) දුබලතාවය සහිත දරුවන්ගේ පුනරුත්ථාපනය ඉහළ නැංවීම සඳහා පවුලෙන් ලැබෙන දායකත්වය ඇගයීමට ලක් කරන්න. අදාළ උදාහරණ සහිතව ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) ප්‍රජා ආකල්ප, අන්තර්කරණය (Inclusion) කෙරෙහි බලපාන්නේ කෙසේද යන්න සාකච්ඡා කර, දුබලතා සහිත දරුවන් කෙරෙහි ධනාත්මක ආකල්ප ඇති කිරීම සඳහා උපාය මාර්ග තුනක් (03) යෝජනා කරන්න. (ලකුණු 08)

12. (i.) දුබලතාවය සහිත දරුවන් සඳහා සුදුසුකම් නිර්ණය කිරීමේදී සහ අධ්‍යාපනික සහය ලබාදීමේදී, දුබලතා සහිත පුද්ගලයන්ගේ අධ්‍යාපන පනත (IDEA) සහ 1973 පුනරුත්ථාපන පනතේ 504 වගන්තිය එකිනෙකට වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) සාමාන්‍ය පන්ති කාමර පරිසරයක් තුළ දුබලතාවය සහිත සිසුන් සඳහා උචිත පහසුකම් සැලසීම (Accommodations) සහ සහය සේවා සැපයීම පිළිබඳව විමසා බලන්න. (ලකුණු 07)

(iii.) දුබලතාවය සහිත සිසුන් වෙනුවෙන් සංක්‍රාන්ති සැලසුම්කරණය (Transition planning) පහසු කිරීමේදී (පුද්ගලබද්ධ ඉගෙනුම් සැලසුම (IEP), වෘත්තීය පුහුණු සූදානම, ප්‍රජා සම්බන්ධතා) පාසල සතු කාර්යභාරය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

13. (i.) අධ්‍යාපන පද්ධතිය තුළ දුබලතා සහිත දරුවන් හඳුනා ගැනීම සහ ඔවුන්ට සහය වීම සම්බන්ධයෙන් පාසල් සතු වගකීම සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(ii.) පුනරුත්ථාපන ක්‍රියාවලියේදී, පන්ති කාමරයේ ඉගෙනුම සැබෑ ජීවිතයේ ප්‍රතිඵල සමඟ සම්බන්ධ කිරීමේදී, විශේෂයෙන් සාමාන්‍ය පන්ති කාමර ගුරුවරුන් දක්වන දායකත්වය විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

(iii.) දුබලතා සහිත දරුවන් සඳහා වන පුනරුත්ථාපන වැඩසටහන්වල සඵලතාවය ඉහළ නැංවීමට ගුරුවරුන්, දෙමාපියන් සහ බාහිර ආයතන අතර පවතින සහයෝගීතාවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

14. (i.) දුබලතා සහිත පුද්ගලයන්ගේ මානව හිමිකම් සම්බන්ධයෙන් රජය සතු ප්‍රධාන කාර්යභාරයන් තුන පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) අන්තර්කරණය සහ සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමේදී, 2003 ශ්‍රී ලංකා ජාතික දුබලතා ප්‍රතිපත්තිය (National Policy on Disability) පදනම් වී ඇති ප්‍රධාන මූලධර්ම විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

(iii.) ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ දුබලතාවයට අදාළ ප්‍රතිපත්ති සහ මානව හිමිකම් රාමු ක්‍රියාත්මක කිරීමේදී පවතින අභියෝග (Challenges) සහ ශක්තීන් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

-සියලුම හිමිකම් ඇවිරිණි.-